**ශීර්ෂය - 265 - මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**-------------------------------------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1** **තත්ත්වාගණනය කල මතය**

**-----------------------------**

මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබදව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**---------------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල යෝග්‍යතාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද අනාවරණය කිරීම් ඇගයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පෙර වර්ෂයේ සංඛ්‍යා අගයන් සමඟ සංසන්දනය කර ඉදිරිපත් කරන ලදී.

(ආ) පසුගිය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මා විසින් කරන ලද නිර්දේශ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලදී.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් අත්තිකාර ගිණුම් ශේෂයන් විගණනය කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය කරන ලදී.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂය අවසානයේදී, විවිධ හේතූන් මත, නිලධාරීන් පස්දෙනෙකු විසින් ගෙවිය යුතු රු.459,531 ක ණය මුදල සම්බන්ධයෙන් කිසිදු ඵලදායී පියවරක් ගෙන නොතිබුණි. | ආයතන සංග්‍රහයට අනුව නිලධාරීන්ගේ ණය ආපසු අයකර ගැනීමට සුදුසු පියවර ගත යුතුය. | අයකර ගැනීම සඳහා අඛණ්ඩ ක්‍රියාමාර්ග ගනිමින් සිටී. |

**(ආ) තැන්පත් ගිණුම් ශේෂයන්**

මූල්‍ය ප්‍රකාශනවල තැන්පතු ගෙවීම් සහ ශේෂයන් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර දෙකකට වඩා වැඩි රු. 4,908,054 ක් වූ තැන්පතු 98 ක් සඳහා මුදල් රෙගුලාසි 571 අනුව අඛණ්ඩ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි වලට අනුකූලව පියවර ගත යුතුය. | වසර දෙකකට වඩා වැඩි තැන්පතු සම්බන්ධයෙන් පියවර ගෙන තිබේ. |

**(ඇ) සීමාව ඉක්මවීම්**

-----------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සීමාවන් විගණනය කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය කරන ලදී.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අත්තිකාරම් අංක 265 ක්‍රියාත්මක කිරීම සඳහා වන අවම ලැබීම් සීමාව පාර්ලිමේන්තුව විසින් රු. 11,000,000 ක් ලෙස අනුමත කර ඇතත්, වර්ෂය තුළ ලැබුණු ලැබීම් ප්‍රමාණය රු. 10,932,117 ක් වීම නිසා අවම ලැබීම් සීමාවට රු. 67,883 කින් ළඟාවී නොතිබුණි. | තක්සේරු සීමාවන් ඉක්මවා නොයන බවට සහතික වීම සඳහා නිසි අවසරය ලබා ගත යුතුය. | නිසි අනුමැතිය ලබා ගැනීම සඳහා පියවර ගනිමින් සිටී. |

**(ඈ) ලේඛණ හා පොත්පත් පවත්වා නොතිබීම**

-------------------------------------------

මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් වාර්තාව නිසි පරිදි හා යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොමැති බව පරීක්ෂණවලින් හෙළි විය. විස්තර පහත පරිදි විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 452 ප්‍රකාරව විගණන විමසුම් වාර්තා නිසිපරිදි නඩත්තු කර නොතිබුණු බව සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය විය. | මුදල් රෙගුලාසි 452 (1) ප්‍රකාරව නිසි ලෙස නඩත්තු කිරීමට පියවර ගත යුතුය. | යාවත්කාලීනව නිසි ලෙස ලේඛණ ගත කරවීමට ක්‍රියාමාර්ග ගනිමින් සිටී. |

## 2. මූල්‍ය කළමණාකරනය

## 2.1 වියදම් කළමණාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රාග්ධන අරමුදල් 7 ක සමස්ථ ප්‍රතිපාදන රු. 67,800,000 ක් වූ අතර එයින් රු. 44,528,474 ක් ඉතිරිවී තිබුණු බව අනාවරණය විය. එය සමස්ථ ප්‍රතිපාදනයෙන් සියයට 65 ක් විය. විස්තර පහත දැක්වේ. | ඵලදායී පාලන කාරක මත පියවර ගත යුතුය. | අනාගතයේ අයවැය සකස් කිරීමේදී ඉතිරිකිරීම් අඩු කිරීමට පියවර ගනු ලැබේ. |

| වැය විෂය | ශුද්ධ ප්‍රතිපාදනය | භාවිතය | ඉතිරිය | ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| 265-1-1-0-2001 | 800,000 | 6,160,197 | 1,839,803 | 23% |
| 265-1-1-0-2002 | 650,000 | 305,054 | 344,946 | 54% |
| 265-1-1-0-2003 | 2,700,000 | 930,050 | 1,769,950 | 66% |
| 265-1-1-0-2102 | 5,350,000 | 3,128,957 | 2,221,043 | 42% |
| 265-1-1-0-2103 | 1,500,000 | 828,830 | 671,170 | 45% |
| 265-1-1-0-2104 | 55,500,000 | 18,195,408 | 37,304,592 | 67% |
| 265-1-1-0-2401 | 1,300,000 | 923,035 | 376,965 | 29% |
| | 67,800,000 | 30,471,531 | 44,528,474 | |

| | | | |
|---|---|---|---|
| (ආ) | වැය විෂය සඳහා අයවැය වෙන් කිරීම රු. 13,500,000 ක් වූ අතර එය වියදම් කිරීමෙන් තොරව වෙනත් වියදම් විෂයයන් සඳහා පරිපූරක 23 ක් හරහා සියයට 4 ක් ද, අදාළ වියදම් විෂයයට රු. 3,105,000 ක් ද වැය කර තිබීම හේතුවෙන් අයවැය කාර්යක්ෂමව සකස් කර නොමැති බව පෙන්නුම් කෙරුණි. විස්තර පහත දැක්වේ. | ඵලදායී පාලන කාරක මත පියවර ගත යුතුය | නිසි ගිණුම් සකස් කර අනාගත අයවැය සැකසීමට සූදානම්වන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇත. |

| වැය විෂය | වෙන්කිරීම | පරිපූරකය | ප්‍රතිශතය |
|---|---|---|---|
| | රු. | රු. | % |
| 265-1-1-0-1202 | 6,250,000 | 1,359,000 | 22% |
| 265-1-1-0-1203 | 1,375,000 | 412,500 | 30% |
| 265-1-1-0-1401 | 1,725,000 | 680,000 | 39% |
| 265-1-1-0-1402 | 3,300,000 | 377,000 | 11% |
| 265-1-1-0-1506 | 850,000 | 276,500 | 33% |
| | 13,500,000 | 3,105,000 | 23% |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වැය විෂය 4 ක් සඳහා අයවැය යටතේ වෙන් කරන ලද රු. 38,050,000 ක් වියදම් සඳහා ප්‍රමාණවත් නොවන බැවින් පරිපූරක යටතේ සියට 8 ඉක්මවූ රු. 3,095,300 ක් වැය විෂයයන් 05 ක් යටතේ ලැබී තිබුණි. විස්තර පහත දැක්වේ. විස්තර පහත දැක්වේ. | ඵලදායී පාලන කාරක මත පියවර ගත යුතුය. | නිසි ගිණුම් සකස් කර අනාගත අයවැය සැකසීමට සූදානම් වන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇත. |

| වැය විෂය | වෙන්කිරීම | පරිපූරකය | ප්‍රතිශතය |
|---|---|---|---|
| | රු. | රු. | % |
| 265-1-1-0-1003 | 33,100,000 | 2,000,000 | 6% |
| 265-1-1-0-1101 | 3,200,000 | 389,500 | 12% |
| 265-1-1-0-1302 | 1,700,000 | 180,800 | 11% |
| 265-1-1-0-1404 | 50,000 | 525,000 | 11% |
| | 38,050,000 | 3,095,300 | 8% |

## 2.2 බැංකු ගිණුම් ක්‍රියාත්මක කිරීම

----------------------------------

මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් බැංකු ගිණුම් සක්‍රීය කිරීම සම්බන්ධ නියැදි පරීක්ෂණ වලදී සොයාගත් අඩුපාඩු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------ | ---------------------------- |
| හඳුනා නොගත් ගෙවීම් ලෙස දක්වා තිබුණු රු.1,371,155 ක් වූ මන්තායි බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2015 සිට මේ දක්වා ලියන ලද චෙක්පත් 49 ක් සම්බන්ධයෙන් එහි නිවැරදිතාවය තහවුරු කර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | හඳුනා නොගත් ගෙවීම් සම්බන්ධයෙන් විමර්ශණයක් සිදුකළ යුතුය. | විමර්ශණයක් සිදුකරමින් පවතී. නියමිත කාලය තුල පිළිතුර ලබා දෙනු ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

## 3.1 කාර්යයසාධනය

-----------------

### 3.1.1 අපේක්ෂිත ප්‍රතිඵල අත් නොවීම

---------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ----------- | ---------------------------- |
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් තල තෙල් නිෂ්පාදනය සඳහා වන යන්ත්‍ර ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් 2018 දෙසැම්බර් 12 දින ගෙන තිබුණු තීරණයට අනුව 2019 අගෝස්තු 20 දිනැති අංක. NNP/MN/A/DS/2019/06 විගණන විමසුමෙන් පසු CML Engineering Export GMPT සමාගමට රු. 4,978,350 ක් වූ චෙක්පත් 02 ක් නිකුත්කර තිබුණද යන්ත්‍රය භාවිතයට ගතහැකි තත්ත්වයට පත්කිරීමට වර්ෂය අවසානය දක්වා ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | යන්ත්‍රය භාවිතා කිරීමට පියවර ගත යුතුය. | මෙම යන්ත්‍ර භාවිතා කිරීමට පියවර ගනිමින් සිටී. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2019 වර්ෂයේදී නැවත පදිංචි කිරීම්, ප්‍රතිසංස්කරණ, උතුරු සංවර්ධන හා හින්දු සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ආධාර ඇතිව මාධු ප්‍රදේශයේ පලතුරු යුෂ නිෂ්පාදනය සඳහා රු. 15,946,525 ක වියදමින් යන්ත්‍ර මිලදී ගෙන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මාධු සමුපකාර සමිතියට ලබා දෙන ලද නමුත් මෙම යන්ත්‍ර 2019 දෙසැම්බර් 31 වන තෙක් මෙම කාර්යය සඳහා භාවිතා කර නොතිබුණි. | යන්ත්‍රය භාවිතා කිරීමට පියවර ගත යුතුය. | මෙම යන්ත්‍ර භාවිතා කිරීමට පියවර ගනිමින් සිටී. |
| (ඇ) | 2019 ගම්පෙරලිය ව්‍යාපෘතිය යටතේ මන්තායි බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ශාන්ත තෝමස් ක්‍රීඩා පිටියේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වූ රු. 484,772.50 ක් වූ කොන්ත්‍රාත්තුවේ 2019 මැයි 02 දින වන විටත් කිසිදු වැඩ කටයුත්තක් සිදු නොවීම හේතුවෙන් අත්තිකාරම වූ රු.96,955 ක් අධි ගෙවීමක් විය. මීට අමතරව, භූමිය තෝරා ගැනීමේදී සිදුව තිබුණු අඩුපාඩු වෙනුවෙන් කිසිදු ප්‍රතිසංස්කරණ කටයුතුක් සිදුකිරීමෙන් තොරව රු. 388,040 ක ක්‍රීඩා උපකරණ මිලදී ගෙන ලබාදී තිබුණි. | කොන්ත්‍රාත් වැඩ නියමිත කාල සීමාව තුළ නිම කළ යුතුය. | අයකර ගැනීමට පියවර ගෙන තිබුණි. |
| (ඈ) | ගම්පෙරලිය ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මන්නාරම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මහජන ශාලාවක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ කොන්ත්‍රාත් වැඩබිම පිරිසිදු කිරීමේ අවශ්‍යතාවයක් නොතිබියදී ඒ වෙනුවෙන් රු. 58,500 ක අතිරේක ගෙවීමක් සිදු කර තිබුණි. | වැඩිපුර ගෙවීම් අය කිරීමට පියවර ගත යුතුය. | වැඩසටහන් 17 න් 10 ක වැඩිපුර ගෙවීම් අයකර ඇත. රඳවා ගැනීමේ මුදල් නිදහස් කිරීමේදී අනෙකුත් ඒවායේ ගැලපීම් සිදු කරනු ලැබේ. |

### 3.1.2 නිම නොකර අතහැර දමා ඇති ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මන්තායි බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ 2017 දී මහජන ශාලාවක් ඉදිකිරීම සඳහා රු. 495,000 ක් ගෙවා තිබුණද, ගොඩනැගිල්ලේ වැඩ නිම කර නොමැති බැවින් භාවිතා කළ නොහැකි විම හේතුවෙන් එය නිශ්කාර්ය වියදමක් විය. | නියමිත කාල සීමාව තුළ වැඩ නිම කර එය භාවිතා කිරීමට පියවර ගත යුතුය. | පිළිගනිමි. 2020 දී ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩ සටහනේ එය යෝජනා කර ඇත. මූල්‍ය ප්‍රතිපාදන ලැබුණු විගස වැඩ නිම කරනු ඇත. |

## 3.1.3 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දී රු. 2,000,000 ක ඇස්තමේන්තුගත වියදමින් දිගු කාලීනව අවතැන් වූ සිංහල හා මුස්ලිම්වරුන් සඳහා යටිතල පහසුකම් වැඩසටහන යටතේ මන්තායි බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සිදු කරන ලද කොන්ත්‍රාත් කටයුතු 2018 දෙසැම්බර් 20 දින නිම කර ඇතත් එම මුදල් භාවිතා කර නොතිබුණි. එම නිසා පෙර පාසල් ගොඩනැගිල්ල පිහිටි ඉඩමෙහි අයිතිය වෙනස් කිරීමට කිසිදු ඵලදායී පියවරක් ගෙන නොතිබුණි. | ගොඩනැගිල්ල භාවිතා කිරීම සඳහා සුදුසු පියවරක් ගත යුතුය. | පෙර පාසල දැනට ක්‍රියාත්මක වන අතර ඉඩම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත භාරදීමට කටයුතු කර ඇත. |
| (ආ) | රු. මිලියන 10 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කොරලිමොට්ටෙයි පාර (අතික්කුෂි නැනට්ටන්) ඉදිකිරීම සම්බන්ධ කොන්ත්‍රාත් වැඩ කොන්ත්‍රාත්කරු විසින් 2019 නොවැම්බර් 23 දින නිම කිරීමට නියමිතව තිබුණද එය 2020 ජනවාරි 09 දින වන විටත් අවසන් කර නොතිබුණි. | නියමිත කාල සීමාව තුළ වැඩ නිම කිරීම සඳහා කොන්ත්‍රාත්තුවට අනුකූලව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | පසු විපරම් කටයුතු සඳහා අදාළ බලධාරීන්ට උපදෙස් දී ඇත. |

## 3.2 ප්‍රසම්පාදන

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කරවීම හා පුනරුත්ථාපන, උතුරු සංවර්ධන හා තරුණ කටයුතු අමාත්‍යාංශයේ 2019 මූලා ප්‍රතිපාදන වලින් මඩු පල්ලි භූමිය තුල වැසිකිළි අදියර - 3 යටතේ වන්දනාකරුවන් සඳහා වැසිකිළි 252 ක් ඉදිකිරීමේ ප්‍රසම්පාදන කමිටු තීරණයට අනුව අඩු වටිනාකමකින් යුත් ලංසුව ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරුට මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ලංසුව ප්‍රදානය කර තිබුණද, මා විසින් පෙර සඳහන් කළ තිබුණු අදහස් දැක්වීම් අනුව ප්‍රමාණවත් අත්දැකීම් නොමැති බව සඳහන් කර තිබුණු මඩු පල්ලියේ වන්දනාකරුවන් සඳහා වැසිකිළි 252 ක් ඉදිකිරීමේ කාර්යයේ අදියර - 2 සඳහා දැනටමත් තෝරාගෙන තිබුණු කොන්ත්‍රාත්කරුම නැවත තෝරාගෙන තිබුණු බව | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ ලංසු සඳහා ආරාධනය අනුව කටයුතු කළ යුතුය. | තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත මෙම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලදී. |

නිරීක්ෂණය විය. ලංසු සඳහා ආරාධනා කොටසේ 09 වන ඡේදය ප්‍රකාරව "එක් කොන්ත්‍රාත්කරුවෙකුට ප්‍රදානය කළ යුත්තේ එක් අදියරක් පමණි" ලෙස සඳහන් වුවද, එකම කොන්ත්‍රාත්කරුට වටිනාකම රු. 22,382,300 ක් වූ කොන්ත්‍රාත් වැඩ දෙකම ප්‍රදානය කිරීම පරස්පර විරෝධී වනු ඇත. විස්තර සඳහා පහත පරිදි වේ.

| වැඩ වර්ගය | වටිනාකම |
|---|---|
| | රු. |
| වැසිකිලි සංකීර්ණ අංක - 02 | 11,287,900 |
| වැසිකිලි සංකීර්ණ අංක - 03 | 11,094,400 |
| ඒකතුව | **22,382,300** |

## 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාල තුනකට අයත් රු. 151,600,000 ක රජයේ වියදමින් 2015 සිට 2019 දක්වා ඉදිකරන ලද නිවාස 208 ක් ඉදිකිරීම සඳහා නුසුදුසු ස්ථාන තෝරා ගැනීම නිසා එ්වායේ හිමිකරුවන් විසින් භාවිතා කිරීමකින් හා නඩත්තු කිරීමකින් තොරව වසර 5 කට අධික කාලයක් හානි වීමට ඉඩහැර තිබුණි. | නිවාස යෝජනා ක්‍රම සම්බන්ධයෙන් වූ ප්‍රතිපාදන පිළිබඳ මූලික පරීක්ෂණ සිදු කළයුතු අතර ඒවායේ භාවිතය පිළිබඳව සුදුසු පරීක්ෂණ සිදුකර ඒවා භාවිතා කිරීම සඳහා පියවර ගත යුතුය. | පිළිගනිමි. විවිධ පුද්ගලික හේතු නිසා එම ස්ථානවල ජීවත්වී නොතිබුණි. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීයාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මානව සම්පත් පුරප්පාඩු පුරවා නොතිබුණු අතර වැඩ කටයුතු කරගෙන යාහැකි අය විසින්ද මෙම කටයුතු සිදු කර නොතිබුණි. විස්තර පහත පරිදි වේ. | නියමිත කාල සීමාව තුළ පුරප්පාඩු පිරවීම සඳහා පියවර ගත යුතුය. | ඉල්ලීම අදාළ දෙපාර්තමේන්තු වෙත ඉදිරිපත් කර ඇත. |

| සේවක වර්ගය | අනුමත කාර්යය මණ්ඩලය | තත්‍ය කාර්යය මණ්ඩලය | පුරප්පාඩු |
| --- | --- | --- | --- |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 34 | 21 | 13 |
| තෘතීය මට්ටම | 19 | 5 | 14 |
| ද්විතීය මට්ටම | 543 | 389 | 159 |
| ප්‍රාථමික මට්ටම | 68 | 44 | 23 |
| **ඒකතුව** | **664** | **459** | **209** |